# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2018 සැප්තැම්බර් මස 07 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2018.09.07 දින නිකුත් කරන ලදී)**


# රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන)

**2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ආරක්ෂක අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, මෙම පනත ක්‍රියාත්මක කිරීම භාරව සිටින අමාත්‍යවරයාගේ ධුරය වෙනස් කිරීමයි.

# රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන)

එල්. ඩී.— ඕ. 23/2018

**2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2018 අංක     දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2007 අංක 58 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**2.** 2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත, එහි 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට "ආරක්ෂාව පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.